**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය**

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන සේවා ගණයේ සත්ත්ව පාලන සහායක තනතුර සඳහා බඳවා ගැනීම**

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ (PL1-2016) සත්ත්ව පාලන සහායක තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති අයදුම්පත අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, පේරාදෙණිය" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සත්ත්ව පාලන සහායක තනතුර සඳහා බඳවා ගැනීම " යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය .

**01.** තනතුර -: සත්ත්ව පාලන සහායක III.
මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
සටහන -විශ්‍රාමික වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

**02.** මාසික වැටුප් පරිමාණය -: රු.24,250 -10x250- 10x270- 10 x300- 12 x330 - 36,410/- (PL-1-2016)
(වැටුප් ගෙවනු ලබන්නේ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන 11 හි සඳහන් පරිදිය.)
මෙම වැටුප් ප්‍රමාණයේ තුන්වන වැටුප් පියවරට එළඹීමට පෙර 1වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුයි.

**03.** වයස් සීමාව -: 2018.09.21 දිනට වයස අවු: 18ට නොඅඩු විය යුතු අතර, අවු: 45ට නොවැඩි විය යුතුය.

**04.** අධ්‍යාපන සුදුසුකම් -: අ.පො.ස(සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**05.** වෘත්තීය සුදුසුකම් -: ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**06.** පළපුරුද්ද -: ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**07.** කායික සුදුසුකම් -: දිවයිනේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට යෝග්‍ය මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**08.** වෙනත් සුදුසුකම් -: i. විශිෂ්ඨ චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. 2018.09.21 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**09.** බඳවා ගැනීමේ ක්‍රමය -: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

★★★ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන්නේ පහත සඳහන් පරිදි වේ.

| | පරීක්ෂාකර ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ |
| II | වෘත්තීය සුදුසුකම් | 20 | |
| III | පළපුරුද්ද | 35 | |
| IV | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| | එකතුව | 100 | |

**10.** සේවා කොන්දේසි

**(i)** පත්වීම ලබන නිලධාරියා රාජ්‍ය ප්‍රතිපත්ති වලටද ,රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග , කාර්ය පටිපාටික රීති ,ආයතන සංග්‍රහයේ විධිවිධාන , මුදල් රෙගුලාසි හා රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසි වලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

**(ii)** බඳවා ගනු ලබන නිලධාරීන් වසර **03** ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත් එක් වසරකට වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ.විවෘත බඳවා ගැනීම් තුලින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව,නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීමද අවශ්‍ය වේ.

**(iii)** රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් දෙවන භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැදී වසර **05** ක් තුල ලබා ගත යුතුය.

**(iv)** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - **2018.09.21**

**(v)** දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

**(vi)** නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්ද මූලික සුදුසුකම් සපුරා නැති අයදුම්පත්ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**(vii)** මෙහි සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් , ඒ සම්බන්ධව තීරණ ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

වෛද්‍ය නිහාල් වෙදසිංහ,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
දිනය -: **2018.08.16**
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. **13**, ගැටඹේ, පේරාදෙණිය.